www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ජෙනරාල් ඉන්දියාවේ ඉහල පෙලේ සංචාරයක

**Sri Lankan general on high-profile trip to India**

**ඩබ්ලිව්. ඒ. සුනිල් සහ කේ. රත්නායක විසිනි**
**2004 ජනවාරි 6**

ශ්‍රී ලංකාවේ වර්ධනය වන දේශපාලන අර්බුදය මධ්‍යයේ, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග, ඉන්දියාවේ ඉහල මිලිටරි නායකයන් හමුවීම පිනිස, මෙරට ආරක්ෂක ප්‍රධානි, ජෙනරාල් ලයනල් බලගල්ල, දෙසැම්බර් මුල දී, ඉන්දියාවට යැවී ය. ශ්‍රී ලංකා මිලිටරියේ ඉහල කොටස්, ජනාධිපති සහ එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව අතර ගැටුම තුල, කෙතරම් නම් පරිමානයක විවෘත දේශපාලන ක්‍රියාකලාපයක්, ඉටු කරත් ද යන වග, මෙම සංචාරය මගින් එලිදරව් විය.

නොවැම්බර් 4 දා, ජනාධිපති, සිය පුලුල් ව්‍යවස්ථා බලතල යෙදා ගනිමින්, අමාත්‍යංශ තුනක් -- ආරක්ෂක. අභ්‍යන්තර කටයුතු හා ජනමාධ්‍ය -- පවරාගෙන, පාර්ලිමේන්තුව සති දෙකකට කල් තබා, හදිසි නීතිය පැනවීම කරා වූ පියවර ද ගත්තා ය. එතැන් පටන්, අගමැති රනිල් වික්‍රමසිංහගේ ආන්ඩුව සමග සම්මුතියකට පැමිනීමේ ප්‍රයත්නයන්, තියුනු අර්බුදයකට ලක් විය.

මිලිටරිය විවෘතවම කුමාරතුංගගේ පැත්ත ගත්තේ ය. එය, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග, ගෙනගිය සාම සාකච්ඡා තුල දී, පමනට වඩා සහන දුන්නේ යයි වික්‍රමසිංහව විවේචනයට ලක් කලේ ය. නොවැම්බර් 4 දාට පෙරාතුව, ඉහල පෙලේ ජෙනරාල්වරු, ආරක්ෂක අමාත්‍යංශය පවරා ගන්නා ලෙස ජනාධිපතිගෙන් ඉල්ලා සිටියේ, ආන්ඩුව, එල්ටීටීඊයට සිය ආයුධ බලය හා කඳවුරු වර්ධනය කරගැනීමට, විශේෂයෙන් ම දිවයිනේ නැගෙනහිර පලාතේ, ඉඩ දීම මගින්, ජාතික ආරක්ෂාව අනතුරේ හෙලා ඇතැයි යන පදනම මත ය.

දෙසැම්බර් 8-11 දිනවල සිය ඉන්දියානු සංචාරය තුල දී, බලගල්ල, ආරක්ෂක සහයෝගිතාව පිලිබඳව සාකච්ඡා කරමින් හා කුමාරතුංගට නව දිල්ලියේ සහයෝගය කොතෙක් දුරට ලැබේ ද යන්න පරෙස්සමින් විපරම් කර බලමින්, ජනාධිපතිනියගේ නියෝජිතයකු මෙන් ම ක්‍රියා කලේ ය. ඔහු ඉන්දියානු ආරක්ෂක ඇමති ජෝර්ජ් ෆර්නැන්ඩෙස් සහ ඉන්දියානු ආරක්ෂක ප්‍රධානීන් ද හමුවිය. කාශ්මීරයේ ඉන්දියානු හා පකිස්ථාන පාලනයට යටත් ප්‍රදේශ බෙදා වෙන් කරන පාලන රේඛාව ද ඔහුගේ චාරිකාවට ඇතුලත් විය. ශ්‍රී ලංකාව බලා ආපසු එන ගමනේ දී, බලගල්ල, දකුනු ඉන්දියාවේ මිලිටරි අන දෙන නිලධාරින් ද හමුවිය.

ඉන්දියානු ආරක්ෂක අමාත්‍යංශයේ ප්‍රකාශකයකුට අනුව, ෆර්නැන්ඩෙස් සහ බලගල්ල, "විවිධ අවශ්‍යතා පිලිබඳ අන්‍යොන්‍ය සහයෝගිතාව සහ ආරක්ෂක සහයෝගිතාව" සම්බන්ධයෙන් සාකච්ඡා කලේ ය. ඉන්දියාව, "ශ්‍රී ලංකාවේ හදිසි ආරක්ෂක අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය සියලු සහයෝගය ලබා දීමට සූදානම්" බව ෆර්නැන්ඩෙස් පෙන්නුම් කලේ ය. බලගල්ල, එල්ටීටීඊය හොරෙන් ආයුධ ගෙන එන බවටත්, සාම සාකච්ඡා අසාර්ථක වුව හොත්, ඔවුන් යුද්ධය සඳහා සූදානම් වන බවටත් කෙරෙන චෝදනා ප්‍රතිරාව කිරීමට, මේ අවස්ථාව යොදා ගති.

ශ්‍රී ලංකාවට පෙරලා පැමිනීමෙන් අනතුරුව, ආරක්ෂක ප්‍රධානියා මාධ්‍යවලට හෙලි කලේ, ඉන්දියාවෙන් සැලකිය යුතු නව මිලිටරි සහයෝගයක් සහතික කරගැනීමට තමන් සමත් වූ බවයි. "හොර බඩු ප්‍රවාහනය ඇතුලු සියලු නීති විරෝධී වැඩ කටයුතු වලකාලීම" පිනිස දෙරටේ නාවික හමුදාවන් සහයෝගීව කටයුතු කිරීම පිලිබඳ ගිවිසුමක් ද මෙයට ඇතුලත් විය. අනෙක් ගිවිසුම්වලින්, ඒකාබද්ධ ඔත්තු සේවා අතර සහයෝගිතාව සහ ශ්‍රී ලංකාවේ කොමාන්ඩෝ භටකායන් පුහුනු කිරීම ආදිය ආවරනය විය. ඉන්දියාව, කොලඹ සහ යුද-ග්‍රස්ත යාපන අද්ධද්වීපය අතර භටයන් ප්‍රවාහනය කිරීම පිනිස ශ්‍රී ලංකාවට මිලිටරි හෙලිකොප්ටර් යානා කුලියට දීමට ද යාපනයේ ප්‍රධාන ගුවන් හමුදා කඳවුර වන පලාලිහි ධාවන පථය, විශාල ඉන්දියානු ප්‍රවාහන යානා බැස්සවිය හැකි පරිදි, අලුත්වැඩියා කිරීමට ද පියවර ගනු ඇත.

ඊට අමතරව, ඉන්දියාව සමග යෝජිත ආරක්ෂක සහයෝගිතා ගිවිසුම (ඩීසීඒ) කඩිනම් කිරීමට ද බලගල්ල උත්සාහ ගති. මෙම ගිවිසුම මුලින් ම යෝජනා වූයේ, ඔක්තෝබරයේ දී අගමැති වික්‍රමසිංහ, ඉන්දියානු අගමැති හමුවූ අවස්ථාවේ ය. මේ පිලිබඳ විස්තර එලිදරව් කෙරී නැති නමුත්, එහි අරමුන වන්නේ, ශ්‍රී

ලංකාව ඉන්දියාවේ මූලෝපායික කක්ෂය තුල තැබීමත් පහසුකම් පොදුවේ පරිහරනය කිරීම ඇතුලු සමීප මිලිටරි සහයෝගිතාවක් සඳහා පහසුකම් සැලසීමත් ය. ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස්, නිරුපම් සෙන්, ඉන් අනතුරුව, කුමාරතුංග හමුවී යෝජිත ආරක්ෂක සහයෝගිතා ගිවිසුම පිලිබඳව සාකච්ඡා කල අතර පසුව අදාල උපදෙස් ලබා ගනු පිනිස දෙසැම්බර් 14 දා නව දිල්ලිය බලා ගියේ ය.

බලගල්ලගේ සංචාරය, කරුනු ගනනාවකින් ම අර්ථභාරී ය. පලමු කොටම, කුමාරතුංග, ආරක්ෂක සහයෝගිතා ගිවිසුම පිලිබඳ සාකච්ඡා ක්ෂේත්‍රය තුල ආන්ඩුව තථ්‍ය වසයෙන් කොන් කිරීමත් එමෙන් ම දෙරට අතර මිලිටරි සහයෝගිතාව සැලකිය යුතු මට්ටමකින් ඉහල දමා ගැනීමත් පිනිස, ආරක්ෂක අමාත්‍යංශයේ සිය ආකාරගත පාලනයත් මිලිටරියේ සහයෝගයත් යොදාගෙන තිබේ. මෙම ගිවිසුම්, එක්සත් ජනපදය සමග සමීප සන්ධානයකින් යුක්තව, ඉන්දියාව විසින්, දකුනු ආසියාව තුල තමන්ට අධිපති ක්‍රියාකලාපයක් සහතික කරගනු පිනිස, ගෙනයනු ලබන වඩා පුලුල් ආර්ථික හා මූලෝපායික යලිපෙලගැසීමක කොටසකි.

ඉන්දියාව හා ශ්‍රී ලංකාව, "විස්තීර්න ආර්ථික හවුල් ගිවිසුමක්" අත්සන් කිරීමට සූදානම් වේ. ඔක්තෝබරයේ දී, ඉන්දියානු සමාගම්, නැගෙනහිර ශ්‍රී ලංකාවේ මූලෝපායික ස්ථානයක පිහිටි ත්‍රිකුනාමලය ස්වාභාවික වරාය අසල දැවැන්ත තෙල් ටැංකි 99ක් බද්දට ගත්තේ ය. ඉන්දියානු තෙල් සමාගම, පෙට්‍රල් ෂෙඩ් 100ක් පවරාගනිමින්, ශ්‍රී ලංකාවේ බල ශක්ති වෙලඳ පොලට ඇතුලු වී ඇති අතර, තෙල් හා ස්වාභාවික වායු සමාගම (ඕඑන්ජීසී), නොගැඹුරු මුහුදේ තෙල් ගවේෂනය සඳහා සූදානම් වේ.

දෙවනුව, ඉන්දියාව සමග ඇති කර ගැනෙන නව ආරක්ෂක ගිවිසුම්. අත්හිටුවා ඇති සාම සාකච්ඡා යලි ඇරඹීමට ආන්ඩුව දරන ප්‍රයත්නයන් සමග සෘජුවම ගැටෙයි. නිවේදනය කෙරී ඇති සියලුම පියවරයන් මගින් කෙරෙන්නේ, එල්ටීටීඊයට එරෙහිව ශ්‍රී ලංකා මිලිටරියේ අත් ශක්තිමත් කිරීමයි. එල්ටීටීඊ නායකත්වය, ඉන්දියානු මිලිටරි සහයෝගය ලැබීම පිලිබඳ ප්‍රවෘත්තියට, තියුනු ප්‍රතිචාරයක් දක්වා ඇත. බලගල්ල පෙරලා පැමිනීමෙන් දින ගනනාවක් ඇතුලත, එල්ටීටීඊයේ ජ්‍යෙෂ්ඨ දේශපාලන නායකයකු වන කෞශල්‍යන්, ශ්‍රී ලංකා භූමිය තුල විදේශ හමුදාවන් යෙදවීමට එරෙහිව අනතුරු ඇඟවී ය.

නව දිල්ලිය, කොලඹ පාලනයේ වත්මන් දේශපාලන අර්බුදය තුල ප්‍රසිද්ධියේ පැති ගැනීමක් සිදු කොට නැති නමුත්, යුද්ධය අවසන් කරලනු පිනිස සම්මුතියක් ඇති කරගැනීමට "සහයෝගීව ක්‍රියා කරන" ලෙස ජනාධිපතිනියගෙන් හා අගමැතිගෙන් ඉල්ලා ඇත. ඇත්ත වසයෙන් ම ගත් කල, ඉන්දියාව, එක්සත් ජනපදය සමග එක්ව, කුමාරතුංග මත පීඩනය යෙදීම මගින්, හදිසි නීතිය පැනවීමෙන් ද තථ්‍ය මිලිටරි ආඥාදායකත්වයක් පිහිටුවීම දෙසට පියවර ගැනීමෙන් ද පසුබැසීමට ඇයට බල කලේ ය. ශ්‍රී ලංකා මිලිටරියට මුක්කු ගැසීම මගින් ඉන්දියාව බලාපොරොත්තු වන්නේ, මහ බලවතුන්, විශේෂයෙන් ම එක්සත් ජනපදය, විසින් පනවන ලද, සාම ක්‍රියාදාමයේ පරාමිති පිලිගැනීමට එල්ටීටීඊයට බල කිරීමටයි.

ඉන්දියානු දේශපාලන සංස්ථාපිතයේ කොටස්, නොවැම්බර් 1 දා ප්‍රසිද්ධ කෙරුනු, අන්තර් ස්වයං-පාලන අධිකාරිය (අයිඑස්ජීඒ) පිලිබඳ එල්ටීටීඊ යෝජනා සම්බන්ධයෙන් විවේචනශීලී විය. භාරතීය ජනතා පක්ෂයේ (බීජේපී) නායකත්වයෙන් යුත් ආන්ඩුව, සාම සාකච්ඡා යලි ඇරඹීමට පදනමක් ලෙස, එල්ටීටීඊයේ සැලසුම ආකාරගතව පිලිගෙන ඇති නමුදු, ආරක්ෂක විශ්ලේෂකයන් හා මාධ්‍ය අටුවාකරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක්, යෝජිත අයිඑස්ජීඒ, දිවයිනේ උතුරේ හා නැගෙනහිර තත්වාකාරයෙන් ම වෙනම රාජ්‍යයක් තහවුරු කිරීමක් ලෙස, විවේචනයනට ලක් කර තිබේ. ඔවුන්ගේ අටුවාවන් මගින් පිලිඹිබු කෙරෙන්නේ, එල්ටීටීඊයට දෙන ඕනෑම සහනයක් ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල බෙදුම්වාදී ව්‍යාපාර -- විශේෂයෙන් ම කාශ්මීරයේ හා තමිල්නාඩුවේ -- තව දුරටත් දිරිගැන්වීමට හේතු වනු ඇතැයි යන්න පිලිබඳ උත්සුකතාවන් ය.

"ශ්‍රී ලංකා-ඉන්දියානු මූලෝපායික සාකච්ඡාව" යන මැයෙන් මෑත කලෙක කොලඹ දී පැවති සම්මන්ත්‍රනයක්, මෙම අදහස් ප්‍රකාශයට පත් කලේ ය. හිටපු ඉන්දියානු විදේශ ලේකම්, එම්. රස්ගෝත්‍ර, එල්ටීටීඊයේ යෝජනා, "අසාධාරන" ලෙස හංවඩු ගැසූ අතර "ඉන්දියාව, ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය හා භෞමික අඛන්ඩතාව පිලිබඳ සිය දෘඪතර කැපවීම යලි අවධාරනය කර ඇතැ"යි සඳහන් කලේ ය. නව දිල්ලියේ ජවහර්ලාල් නේරු විශ්වවිද්‍යාලයේ මහාචාර්ය එස්.ඩී. මුනි, එල්ටීටීඊය "සැලකිය යුතු දේශපාලන මෙන් ම මිලිටරි-උපායික ජයග්‍රහන ලබාගැනීමට" සටන් විරාමය යොදා ගෙන ඇතැයි ද වික්‍රමසිංහගේ ආදර්ශ පාඨය වී ඇත්තේ "ඕනෑම වියදමකින් සාමය" යයි ද පවසමින්, කොලඹ ආන්ඩුව පිලිබඳ කුමාරතුංග ඉදිරිපත් කරන ආකාරයේ විවේචනයන් ම ප්‍රකාශයට පත් කලේ ය.

තෙවනුව, බලගල්ලගේ සංචාරය, මිලිටරියේ වැඩෙන දේශපාලන මැදිහත්වීම පිලිබඳ තවත් දර්ශකයකි. ශ්‍රී ලංකාවේ ආරක්ෂක විශ්ලේෂක ඉක්බාල් අතාස් විසින් දෙසැම්බර් 21 දා *සන්ඩේ ටයිම්ස්* පත්‍රයට සපයන ලද ලිපියක්, ඡන්දයෙන් තේරී පත්වූ ආන්ඩුවට තමන් වගකීමට බැඳී ඇතැයි තව දුරටත් නො සලකන, මිලිටරි ප්‍රධානීන්ගේ, පැහැදිලි පාර්ශ්වීය ක්‍රියාකලාපය සටහන් කලේ ය. "(වික්‍රමසිංහ) සිය විශ්වාසවන්තයකුට කියා සිටියේ, ආරක්ෂක විෂය ක්ෂේත්‍රය ආන්ඩුවෙන්

ඉවත් කෙරුනු තැන් පටන්, තමන්ට හෝ තමන් විසින් නම් කෙරුනු කවරෙකුට හෝ කිසිදු ආකාරගත නිල වාර්තාවක් නො ලැබෙන බවයි. කලින් තමන්ට ඉදිරිපත් කෙරුනු, රහස් ඔත්තු වාර්තාවන් එකක් වත් දැන් තමන්ට නො ලැබෙන බවයි.”

බලගල්ල, නව ආරක්ෂක ගිවිසුම් පිලිබඳව, මාධ්‍යවලට කල ප්‍රකාශ, සාමාන්‍යයෙන් මිලිටරි ප්‍රධානියකුට අදාල දේ නො වන බව අතාස් පෙන්වා දෙයි. “පරම වසයෙන් ගත් කල, ප්‍රකාශ නිකුත් කිරිම, ආරක්ෂක අමාත්‍යංශයේ හෝ ජනාධිපති ලේකම් කාර්යාලයේ වගකීමක් විය යුතුව තිබුනි. . . . සාමාන්‍යයෙන්, (එජාපෙ පාලනය යටතේ පවත්නා) විදේශ අමාත්‍යංශයේ දායකත්වය ද ඒ සඳහා අවශ්‍ය වනු ඇත. එවිට, ජාතික පිලිවෙත පිලිබඳ ඇඟවුම් ද ඇතුලු සියලු පාර්ශ්වයන් ගැන සැලකිල්ල යොමු කරමින් කාරනා පහසුවෙන් ම පැහැදිලි කල හැකි වනු ඇත.”

ඔහු සිය ලිපිය සමාප්ත කලේ මෙසේ පවසමිනි: “ජනාධිපති කුමාරතුංග හා අගමැති වික්‍රමසිංහ යන දෙදෙනාටම, ආරක්ෂක අංශය තුල මෙම හිඩැස දිගටම පැවතීමට ඉඩ හැරීම අතිශයින්ම අනතුරුදායක වනු ඇතැයි යන්න, අවබෝධ කරගැනීමට කාලයයි මේ. . . . තමන්ගේ මිලිටරි යන්ත්‍රනයන් නිසි පරිදි පවත්වා ගැනීම හා තමන්ගේ සේනාවන් ඉහල මට්ටමේ සූදානමකට ගෙන ඒම කල යුතු ජෙනරාල්වරු, දේශපාලනඥයන්ගේ ක්‍රියාකලාපය ඉටු කරන්ට ගිය හොත්, වඩා බරපතල මොට්ටකම් පිලිබඳ දැවැන්ත අන්තරායක් පවතී.”

මිලිටරිය පිලිබඳව විවේචනශීලී වනවා වෙනුවට, අතාස් යනු, කොලඹ මිලිටරි හා රහස් ඔත්තු සංස්ථාපිතය සමග ඉතා සමීප සබඳතා පවතින තැනැත්තෙකි. කෙසේ වෙතත්, දේශපාලනය තුල මිලිටරියේ මැදිහත්වීම පිලිබඳ තියුනු අනතුරු ඇඟවීමකින් සිය ලිපිය අවසන් කිරීමටත්, වත්මන් අර්බුදය විසඳාගන්නා ලෙස ජනාධිපතිට හා ආන්ඩුවට ආයාචනා කිරිමටත් ඔහුට බල කෙරී ඇත. කෙසේ වෙතත්. පාලක ප්‍රභූන් තුල පවත්නා විසඳාගත නො හැකි භේදයන් මගින් අදහස් කෙරෙන්නේ, මිලිටරිය වඩා දැවැන්ත දේශපාලන ක්‍රියාකලාපයක් ඉටු කිරීමට ඉඩ ඇති බවයි.

© www.wsws.org